2

Article 12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019-10-17

පැමිණිලි පාර්ශවය : එච්.එම්. පුෂ්පා පද්මිණී මිය,
224, කොස්දෙණිය,
කුරුණෑගල.

වගඋත්තර පාර්ශවය : 01 සභාපති,
මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

02 නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී,
මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

පැමිණිලි අංකය : **HRC/2498/15**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2015 ජූනි 15 වන දින මහජන බැංකුවේ කළමණාකරන පුහුණුවන්නන් සඳහා වන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අතර, මෙම සම්මුඛ පරීක්ෂණය 2015 ජූනි 19 වන දින දක්වා පැවැත්වූ බවත් 2015-06-24 වන දින මේ සඳහා අදාළ සියලුම පත්වීම් සිදු කරන ලද බවත්ය. තවද



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මෙම පත්වීම් ලබාදී ඇත්තේ සුදුසුකම්, සම්මුඛ පරීක්ෂණ ලකුණු, පරිපාලන හා දේශපාලන කරුණු මත වෙනස් කිරීමෙන් පසුව වන බවයි.

පැමිණිලිකාරිය මෙම පැමිණිල්ල කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් තම මූලික අයිතිවාසිකම් කඩවූ බවට ප්‍රකාශ කිරීමත් සහ අදාළ තනතුර පෙර දුන් අයට ලබා දුන් දිනයේ සිට තමා හට ලබා ගැනීමත් අපේක්ෂා කරන බව දන්වා ඇත.

මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු =:

පැමිණිලිකාරිය මෙම මුල් පැමිණිල්ල සමග අදාළ ලේඛන වල පිටපත්ද ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම පත්වීම සඳහා වූ බැංකුවෙන් යවන ලද කැඳවීම් ලිපිය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල ලේඛනය, මෙම පත්වීම සඳහා වූ බැංකුව විසින් නිකුත් කළ දැන්වීම් පත්‍රය, මොරටුව විශ්වවිද්‍යාලයෙන් පැමිණිලිකාරියට ප්‍රදානය කළ උපාධි සහතිකය, ඩිප්ලෝමා ඉන් මැනේජ්මන්ට් එකවුන්ටින් සහතිකය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රදානය කළ සහතික යන සහතික ඉදිරිපත් කර ඇත.

මෙම පැමිණිල්ල පිළිබඳව සභාපති මහජන බැංකුවෙන් 2015-07-17 දිනැති ලිපියෙන් වාර්තාවක් කැඳවා ඇති අතර එම ලිපියට පිළිතුරු වශයෙන් මහජන බැංකු ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී විසින් 2015-08-24 දිනැති වාර්තාව කොමිෂන් සභාවට 2015-09-01 දින ලබාදී ඇත. එම වාර්තාවෙන් දක්වා ඇත්තේ, කළමණාකරන (පුහුණු) තනතුරට බඳවා ගැනීම සඳහා යෝග්‍යතාවය විමසා බැලීමට මූලික පියවර වශයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද තරග විභාගයෙන් සමත්ව බැංකුවේ පරිචය අනුව යෝග්‍යතාවය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයෙන් පසුව එකී තනතුර සඳහා තෝරා නොගන්නා ලද හෙවත් යෝග්‍යතාවය ඔප්පු කිරීමට අසමත් වූ අයදුම්කාරියක වූ එච්.එම්.පී. පද්මිනී මහත්මිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවයි. මෙකී පැමිණිල්ල මගින් කළමණාකරන (පුහුණු) තනතුර සඳහා යෝග්‍යතාවය විමසා බැලීමේ ප්‍රථම අදියර වශයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද කොටස් දෙකකින් සමන්විත යෝග්‍යතා පරීක්ෂණයෙන් පැමිණිලිකාරිය සමත්ව සිටියද, පැමිණිලිකාරියට අදාළ පත්වීම ලබාදී නොමැති බවද දක්වා ඇත.

තවද මෙම කළමණාකාර (පුහුණු) තනතුර සඳහා බැංකුව විසින් පළ කරන ලද දැන්වීමට අනුව අයදුම්කරුවන් 5753 දෙනෙකු අයදුම් කොට තිබූ බවත් ඉන් 2261 ක් යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා තිබූ බවත් මෙම පරීක්ෂණය පැවැත්වීමේ වගකීම ශ්‍රී ලංකා විභාග

දෙපාර්තමේන්තුව වෙත බැංකුව විසින් පවරා දී තිබූ අතර ඒ අනුව එම පරීක්ෂණය කොටස් දෙකකින් පැවැත්වීමට එම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කොට තිබූ බවත් සඳහන් කර ඇත. තවද මූලික සුදුසුකම් ලද සියලු අයදුම්කරුවන් වෙනුවෙන් පරීක්ෂණයේ පළමු කොටසින්ද අනතුරුව පළමු කොටසින් සමත් වූ අයදුම්කරුවන් වෙනුවෙන් දෙවන කොටස වශයෙන් අදාළ පරීක්ෂණයද විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද බවද දක්වා ඇත. ඒ අනුව අයදුම්කරුවන් 672 ක් යෝග්‍යතා පරීක්ෂණයේ දෙවන කොටස සමත්ව තිබූ අතර ඉන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට අවශ්‍ය කඩඉම් ලකුණු සංඛ්‍යාව ඉක්මවා සිටි අයදුම්කරුවන් 395 ක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද බවත් ඉන් 376 ක් සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන ලද බවත් සඳහන් කර ඇත. තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පැමිණිලිකාරියද සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලද බවත්, සම්මුඛ පරීක්ෂණයේදී නියමිත කුසලතා මට්ටමට ළඟා වීමට පැමිණිලිකාරිය අපොහොසත් වී තිබූ බවත්, එසේම බැංකුව විසින් කළමණාකරන පුහුණුවන්නන් 125 ක් බඳවා ගැනීමට අපේක්ෂා කළද සම්මුඛ පරීක්ෂණයේදී බැංකුව බලාපොරොත්තු වූ කාර්ය සාධන මට්ටම සැපිරූ අයදුම්කරුවන් 109 ක් පමණක් තෝරා ගැනීමට බැංකුවට සිදු වූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකාරියද ඇතුළුව අයදුම්කරුවන් 267 ක් සම්මුඛ පරීක්ෂණයේදී නියමිත කුසලතා මට්ටමට පැමිණීමට නොහැකිව අසමත් වන ලද බව වගඋත්තරකරුවන් තවදුරටත් සඳහන් කර ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාරිය කිසිදු අසාධාරණයට ලක් නොකළ බව දන්වා ඇත.

පැමිණිල්ලට අදාළව ඉදිරිපත් කර ඇති වගඋත්තරකරුගේ 2015-12-21 දිනැති වාර්තාවට අනුව පැමිණිලිකාරිය විසින් කළමණාකරන (පුහුණු) තනතුර සඳහා 2013 වසරේදී අයදුම්පත් කැඳවන අවස්ථාවේදී අවම සුදුසුකම වන පිළිගත් විශ්ව විද්‍යාලයක දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත උපාධියක් ලබා අයදුම්පත් ඉදිරිපත් කොට තිබූ බව දක්වා ඇත.

පැමිණිලිකාරිය විසින් පැමිණිල්ලේ සඳහන් කර ඇති ආකාරයට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය හා එක්සත් රාජධානියේ වරලත් කළමණාකරන ගණකාධිකාරී ආයතනයේ පාඨමාලා හදාරන බව දැක්වේ. පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන අවස්ථාව වන විටද එම පාඨමාලා අවසන් කොට නොතිබූ බවද කියා සිට ඇත.

වගඋත්තර පාර්ශවය දක්වා ඇත්තේ, අවම සුදුසුකම් සපුරා කළමණාකරන පුහුණුවන්නන් බඳවා ගැනීම සඳහා වන මූලික පිවිසුමක් ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන ලද යෝග්‍යතා පරීක්ෂණයෙන් පළමු කොටසට (සාමාන්‍ය ඉංග්‍රීසි දැනුම මැන බැලීම සඳහා) මුළු ලකුණු 100 න් ලකුණු 66 ක් පමණක් ලබා (සමත්වීම සලකා බලනු ලැබුවේ සාමාන්‍ය ලකුණු 40 ක් ලෙසය) එම දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද යෝග්‍යතා පරීක්ෂණයේ දෙවන කොටස සඳහා සුදුසුකම ලබා තිබූ බවයි. ඒ අනුව තරග විභාගයේ දෙවන කොටස ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වූ අතර,

(උසස් ඉංග්‍රීසි දැනුම සහ බුද්ධි පරීක්ෂණ) එහිදී මෙම පැමිණිලිකාරිය විසින් මුළු ලකුණු 200 ත් 107 ක් ලබා තිබුණු බවත්, මෙහිදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ කඩඉම් ලකුණු මට්ටම 100 ක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබූ අතර, පැමිණිලිකාරිය විසින් ලකුණු 107 ක් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා තිබූ බවත්ය. තවද වගඋත්තරකරුවන් විසින් දන්වා ඇත්තේ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී පෞරුෂත්වය (Personality) සන්නිවේදන හැකියාව (Communication Skill) යෝග්‍යතාවය හා පසුබිම (Relevancy and Background) සහ අතිරේක විභවයන් (Extra Potentials) යන නිර්නායකයන් මූලික කොට පරීක්ෂණයට ලක්කොට තිබූ බවයි. මෙම සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් පැමිණිලිකාරිය එහිදී මුළු ලකුණු 100 න් ලකුණු 31 ක් පමණක් ලබා ගත් බව වගඋත්තරකාර බැංකුව සඳහන් කර ඇත. එබැවින් යෝග්‍යතා පරීක්ෂණයේ දෙවන කොටසේ ලකුණු 107 ක් සහ සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 31 ක් ලෙස පැමිණිලිකාරිය මුළු ලකුණු 138 ක් පමණක් ලබා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් 376 දෙනාගෙන් 329 වන ස්ථානය ලබා තිබූ බව දක්වා ඇත. තවද මෙම කළමණාකරන පුහුණුවන්නන් ලෙස ඉහළම යෝග්‍යතාවය පෙන්වූ අයදුම්කරුවන් අතරින් 109 වන ස්ථානයට සුදුසුකම් ලැබූ අයදුම්කරුගේ මුළු ලකුණු සංඛ්‍යාව වූයේ ලකුණු 170 ක් බවද දක්වයි.

එබැවින් පැමිණිලිකාරිය විසින් දක්වන ලද කුසලතාවය අනුව ඇයට හිමිව තිබූ ස්ථානය අනුව අදාළ තනතුර ලැබීම සඳහා ප්‍රමාණවත් නොවූ බැව් වගඋත්තරකරු දක්වයි. මෙම වාර්තාවෙන් පසුව පැමිණිලිකාරිය විසින් ප්‍රතිවාර්තාවක් ඉදිරිපත් කර ඇත. එකී වාර්තාවේ පැමිණිලිකාරිය වගඋත්තරකාර පාර්ශවයන්ගේ වාර්තාවේ සඳහන් වූ කරුණු වලට පිළිතුරු දෙමින් සඳහන් කර ඇත්තේ, මූලික සුදුසුකම් ඇය විසින් සපුරා ඇති බව පිළිගන්නා අතර අමතර සුදුසුකමක් ලෙස දක්වා ඇති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරන ආයතනයේ හා එක්සත් රාජධානියේ කළමණාකරන ගණකාධිකාරී පාඨමාලා සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාව වනවිටද සම්පූර්ණ කර නොමැති බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් පැමිණිලිකාරිය කියා සිට ඇත්තේ මූලික සුදුසුකම් සපුරා තිබීම යන කරුණ උක්ත තනතුර සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රමාණවත් වන අතර අනෙකුත් අමතර සුදුසුකම් සම්පූර්ණ කර නොතිබීම උක්ත තනතුර සඳහා ඉල්ලීම් කිරීමට බාධාවක් නොවන බවත් එකී සුදුසුකම් උක්ත තනතුර සඳහා ඉල්ලුම් කිරීමේදී වාසිදායක සහ අමතර සුදුසුකමක් පමණක් වන බවත්ය.

තවද පැමිණිලිකාරිය සඳහන් කර ඇත්තේ, සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ලද ක්‍රියාපටිපාටියට අනුව ලකුණු ලබාදීම සඳහා ප්‍රධාන අංග 4 ක් එනම් පෞරුෂත්වය, සන්නිවේදන හැකියාව, යෝග්‍යතාවය හා පසුබිම් සහ අතිරේක විභවයන් යන නිර්නායක පදනම් කොටගෙන ලකුණු ලබාදී ඇති බව සඳහන් කළද මෙකී සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100 ත් 31 පමණක් පැමිණිලිකාරිය ලබා ඇති බව වගඋත්තරකරුගේ 2015-12-21 දිනැති වාර්තාවේ සඳහන්ව ඇතත්

එහි ලකුණු 31 ක් ලබා ඇත්තේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ලද නිර්නායක 4 න් කුමන නිර්නායකයටද යන්න් තනි තනි නිර්නායකයන්ට ලබා ගන්නා ලද ලකුණු ප්‍රමාණවත්ව සඳහන් කොට නොමැති බවයි. එබැවින් පැමිණිලිකාරිය කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත්තේ මීට පෙර 2015-11-26 දින පැවැත්වූ පරීක්ෂණයේදී ඉල්ලීම් කළ පරිදි සම්මුඛ පරීක්ෂණය සියලුම අයදුම්කරුවන්ට හා ඇය හට පරීක්ෂණ මණ්ඩලය මගින් ලකුණු ලබා දෙන ලද ලකුණු වාර්තාවේ මුල් පිටපතෙහි සත්‍ය පිටපතක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස නියෝගයක් කරන ලෙසයි.

වගඋත්තරකාර පාර්ශවීය බැංකුව විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් ලකුණු ලබා දෙන ලද වාර්තාවේ මුල් පිටපත කොමිෂන් සභාවට ලබා නොදීම හේතුවෙන් නැවත වරක් 2016-08-05 වන දින කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස පාර්ශවකරුවන්ට දන්වා ඇත. එම පරීක්ෂණයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් සියලූ අයදුම්කරුවන්ට ලකුණු ලබා දුන් මුල් පිටපත කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කරන ලද දැනුම්දීමට අනුව වගඋත්තරකාර මහජන බැංකුව විසින් කළමණාකරන (පුහුණු) තනතුරු සඳහා වූ 2015 වර්ෂයේ පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් අවසන් වරට නිකුත් කළ ලකුණු වාර්තාවේ මුල් පිටපතෙහි සත්‍ය පිටපතක් මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

නිරීක්ෂණ :-

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වූ කරුණු අනුව පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් තහවුරුවේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීමේදී පෙනී යන පහත සඳහන් කරුණු වඩාත් අවධානය යොමු කර ඇත..

පැමිණිලිකාරිය මෙම කළමණාකරන (පුහුණු) තනතුරට අදාළව අයදුම්පතක් ඉදිරිපත් කළපසු ඒ සඳහා මූලික සුදුසුකම් සපුරා තිබූ බවද ඊට අදාළ වඩාත් සුදුසුකම් ඇති පුද්ගලයින් තෝරා ගැනීම සඳහා පවත්වන ලද විභාග දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යෝග්‍යතා පරීක්ෂණ විභාගයේදී ඒ සඳහා සුදුසුකම් ලබා තිබූ බව වගඋත්තරකරුවන්ද අවිවාදයෙන් යුතුව පළිගන්නා කාරණාවකි. පැමිණිලිකාරිය පසුව අදාළ තනතුරට ඇබෑර්තු වී පැවති තනතුරු 125 ක් සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයටද කැඳවීමට සුදුසුකම් ලබා තිබූ බව පිළිගන්නා කාරණාවකි. පැමිණිලිකාරියට මෙම තනතුරට අදාළව පත්වීමක් ලබා ගැනීමට නොහැකි වන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ඒ සඳහා ලකුණු ලබාදීමේදී ප්‍රමාණවත් ලකුණු ලබා ගැනීමට නොහැකි වීමෙන් බව වගඋත්තරකරුවන් පෙන්වා දෙන ලද කරුණු අනුව පෙනී ගියද එකී කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් වඩාත් වැදගත් ලේඛනයක් ලෙස සලකා එකී සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දුන් ලේඛනය වෙත අවධානය යොමු කර ඇත. 2015 වසරට අදාළව පවත්වන ලද කළමණාකරන (පුහුණු) තනතුර

සඳහා වූ අවසාන ලකුණු ලැයිස්තුව කොමිෂන් සභාවේ පරීක්ෂණයට ඉදිරිපත් කර තිබූ අතර එකී
සම්මුඛ පරීක්ෂණය 2015 ක් වූ ජූනි මස 12, 13, 14, 15 සහ 16 යන දිනයන්හිදී පවත්වා ඇති බවද
පෙනී යයි. මෙම සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂකවරුන් තිදෙනෙකු ඉදිරියේ සිදු කළ පසු සම්මුඛ
පරීක්ෂණයේ ලකුණු එකී පරීක්ෂකවරුන් තිදෙනා විසින් වෙන වෙනම ඔවුන්ට සම්මුඛ පරීක්ෂණයේදී
ඉදිරිපත් වූ අයදුම්කරු පිළිබඳ සලකා බලා ලකුණු ලබාදීමට අවස්ථා 3 ක් වෙන් වෙන්ව ලබාදී තිබූ
බව පැහැදිලි වේ. පසුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් දෙන ලද ලකුණු එකතු කොට තුනෙන්
බෙදා එකී ලකුණු විභාග ප්‍රතිඵල මත ලබා ගන්නා ලද ලකුණු වලට එකතු කොට ඒ අනුව ඉහළ
ලකුණු ලබා ගත් සුදුසුකම්ලාභීන් හට පත්වීම් ප්‍රදානය කළබව තහවුරු වේ.

නමුත් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියට කැඳවා සිටි
191 දෙනෙක් වෙනුවෙන් ලකුණු ලබාදී ඇත්තේ කිසිදු අවස්ථාවක සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඒ
සඳහා ලකුණු ලබා දුන් ආකාරයටම නොවන බව අදාළ ලේඛනය පරීක්ෂා කිරීමේදී හොඳින්
අවධාරණය කළයුතු කාරණාවක් බව නිරීක්ෂණය වේ. එනම් එම අයදුම්කරුවන් 191 දෙනා
වෙනුවෙන්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ පරීක්ෂකවරුන් තිදෙනා විසින් එක් අයදුම්කරුවෙකු සඳහා
එකසමාන ආකාරයේ ලකුණු ලබාදීමක් සිදු කරමින් 191 දෙනා වෙනුවෙන්ම විවිධ ආකාරයට ලකුණු
ලබාදී ඇති ආකාරයක් පෙනී යන බැවිනි. එකී ලේඛනයට අනුව පළමු අයදුම්කරුට සම්මුඛ පරීක්ෂණ
මණ්ඩලයේ තිදෙනා විසින්ම 42 බැගින් ලබාදී තිබීම ද, දෙවන අයදුම්කරුට තිදෙනා විසින්ම 70
බැගින් ලබාදී තිබීමද තෙවන අයදුම්කරුට තිදෙනා විසින්ම 66 බැගින් ලබාදී තිබීමද ලෙස සම්මුඛ
පරීක්ෂණ මණ්ඩලයේ තිදෙනා විසින්ම එකසමාන ලකුණු ප්‍රදානය කරමින් 191 දෙනා වෙනුවෙන්ම
එවැනි ආකාරයකට විවිධ ලකුණු ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තිදෙනා විසින් ඔවුන් ඉදිරියට පැමිණ සම්මුඛ පරීක්ෂණයට මුහුණ
දුන් අයදුම්කරුවෙකු සඳහා පරීක්ෂකවරයා විසින් හඳුනා ගන්නා ලද කරුණු මත පදනම්ව ස්වාධීන
වූ පදනමකට පරීක්ෂකවරයා හඳුනා ගත් හේතු මත ලකුණු ලබා දුන් ආකාරයක් කිසිදු අවස්ථාවක
නිරීක්ෂණය නොවේ. එක් අයදුම්කරුවෙකුට ලකුණු ලබා දුන් ආකාරය යම් සංඛ්‍යාවක් වේ නම් එය
තිදෙනා විසින්ම එකම අංකයක් ලෙස සලකා ලකුණු ලබාදී ඇත.

පැමිණිලිකාරියට මෙහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තිදෙනා විසින්ම 31 බැගින් ලබාදී මුළු ලකුණු
93 ක් ලෙස එකතු කොට නැවත තුනට බෙදා මුළු ලකුණු 31 ක් ලෙස සලකුණු කර යෝග්‍යතා
පරීක්ෂණයේදී ලකුණු ලබා ගත් 107 ක මුළු ලකුණු වලට එකතු කොට එය මුළු ලකුණු 138 ක්
කොට මෙකී තනතුරට තෝරා ගැනීමට තරම් ප්‍රමාණවත් ලකුණු ලබා නොගත් නොතේරුනු අයෙකු
ලෙසට එකී සම්මුඛ පරීක්ෂණ ලකුණු වාර්තාවේ සටහන් තබා ඇති බව නිරීක්ෂණය වේ. සම්මුඛ
පරීක්ෂණයට මුහුණ දුන් කිසිදු අයෙකුට සම්මුඛ පරීක්ෂණයේදී ඔවුන් ලකුණු ලබා දුන්නේ කුමන
කරුණු කාරණා හෝ සුදුසුකම් සලකා බලාද යන්න හඳුනා ගත නොහැකි අතර ඒ පිළිබඳ වාර්තා

කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ද හැකියාවක් තිබී නැත. මෙම ලකුණු ලබාදීමේ ආකාරය පරීක්ෂා කිරීමේදී බැලූ බැල්මට පෙනී යන කාරණාවක් වන්නේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලැබූ කිසිදු අයෙකුට සාධාරණ සම්මුඛ පරීක්ෂණයක් සිදුවී ඇති බවක් පෙනී නොයන බවයි. විශේෂයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලකුණු ලබාදීමේදී අනුගමනය කර ඇති පදනම් විරහිත ක්‍රම වේදයේ අහිතකර ප්‍රතිඵල මෙම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්ව තෝරා පත්වීමට සුදුසුකම් නොලැබුණු සියලු පිරිසට අසාධාරණයක් ඇතිවූ එකක් බව පැහැදිලිවම අනාවරණය වන බව පෙන්වා දිය යුතුය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තමන් කැමති අයෙකු තෝරා පත් කර ගැනීමට හෝ පුද්ගලික හේතු මත යම් අයෙකු තෝරා පත් කර ගැනීමට අවශ්‍ය බව තීරණය කර ගනිමින් කටයුතු කළහැකි අවස්ථාවක් බව මෙවැනි සම්මුඛ පරීක්ෂණයකදී සිදුවිය හැකි බව පෙන්වා දිය යුතුය.

නිගමනය :-

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් මෙම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමට අනුගමනය කර ඇති ක්‍රියාපරිපාටිය තුලින් නීතියේ ඇති සර්ව සාධාරණත්වයේ හෝ සාමානාත්මතාවයේ අයිතිවාසිකම අහිමි වී ඇති බවද වගඋත්තරකරුවන්ගේ පරිපාලන හා විධායක ක්‍රියාවන් තුලින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාමේ සඳහන් මූලික අයිතිවාසිකම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. ඒ අනුව පැමිනිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවීම තවදුරටත් වළක්වා ගැනීම සඳහා පැමිණිලිකාරිය නැවත සම්මුඛ පරීක්ෂණයකට භාජණය කර එහිදී පැමිණිලිකාරිය නියමිත සුදුසුකම් සපුරන්නේ නම් ශ්‍රී ලංකා මහජන බැංකුවේ කළමණාකරු (පුහුණු) තනතුර ලැබීමට හිමිකම තිබූ දිනට ගලපා එම තනතුර ලබාදීමට පියවර ගතයුතු බවද,

2. ශ්‍රී ලංකා මහජන බැංකුවේ විධායක හා පරිපාලන අංශ විසින් තවදුරටත් මෙවැනි ආකාරයකට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේදී මූලික අයිතිවාසිකම් කඩවීමේ තත්වයන් ඇති කිරීම වළක්වා ගැනීමට වගඋත්තරකරුවන් විසින් කටයුතු කළයුතු බවටද මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019 . 11 . 29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණි මුත්තෙට්ටුවේගම
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/